ප්‍රධාන ලේකම් කාර්යාලය - උතුරු මැද පළාත - අනුරාධපුර
பிரதான செயலாளர் அலுவலகம் - வடமத்திய மாகாணம் - அனுராதபுரம்
OFFICE OF THE CHIEF SECRETARY - NORTH CENTRAL PROVINCE - ANURADHAPURA

උතුරු මැද පළාත් සභා සංකීර්ණය, 4 වන මහල B, හරිශ්චන්ද්‍ර මාවත, අනුරාධපුරය.
வட மத்திய மாகாண சபை கட்டிடத் தொகுதி, 4ம்மாடி "ஆ" ஹரிச்சந்திரா மாவத்த, அனுராதபுரம்.
North Central Provincial Council Complex 4th Floor B, Harischandra Mawatha, Anuradhapura.

ප්‍රධාන ලේකම්
பிரதான செயலாளர்
Chief Secretary

දුරකථනය / தொ.பே.இல / Tele: 025-2222695
විමසීම් / விசாரணை / Inquiries: 025-2235790
Fax : 025-2224914
E-mail csncpc@gmail.com

මගේ අංකය / எனது இல. / My No.: NCP/CS/ED/11/3-1

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.12.24

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 06/2024

උතුරු මැද පළාත්

සියළුම ලේකම්වරුන් / නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු තුල සිදු කරනු ලබන අභ්‍යන්තර ස්ථාන මාරු

රාජ්‍ය සේවා කොමිෂන් සභා බලතල පැවරීමේ චක්‍රලේඛ 01/2024 අනුව ඒකාබද්ධ සේවාවන්ට අයත් තනතුරු වල වාර්ෂික ස්ථාන මාරු , අනුමත ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කරන අතර අමාත්‍යාංශ තුල හා දෙපාර්තමේන්තු තුල සිදු කරන ස්ථානමාරු හා ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන දෙපාර්තමේන්තුගත තනතුරු වල ස්ථාන මාරු සිදු කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට බලතල පවරා ඇත.

02. එකී බලතල පැවරීමට අනුව , ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් අවිධිමත් අයුරින් අභ්‍යන්තර ස්ථානමාරු සිදු කරන බවට ගරු ආණ්ඩුකාරතුමාට හා මා වෙත පැමිණිලි ලැබී ඇත. එම හේතුවෙන් දෙපාර්තමේන්තු තුල අභ්‍යන්තර ගැටළු නිර්මාණයවී ඇති බවත් ආයතන වල අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යැමේදී ගැටළුකාරී තත්වයන් ඇතිවී ඇති බව නිරීක්ෂණයවී ඇත.

03. එබැවින් , සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින්ම දෙපාර්තමේන්තුගත තනතුරු වල අභ්‍යන්තර ස්ථාන මාරු සිදු කිරීම සඳහා විධිමත් ස්ථානමාරු ප්‍රතිපත්තියක් සකස් කර එය අමාත්‍යාංශ ලේකම් මඟින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර 2025.01.31 දිනට පෙර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.

04. එලෙස අනුමත ස්ථාන මාරු ප්‍රතිපත්තියක් නොමැතිව මින් ඉදිරියට අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සිදු නොකරන මෙන් මෙයින් දන්වා සිටින අතර යම් විශේෂිත හේතුවක් මත අභ්‍යන්තර ස්ථාන මාරු සිදු කිරීමට අවශ්‍යවේ නම් ඒ පිළිබඳව මා වෙත පූර්ව දැනුම්දීමක් සිදු කර අදාළ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කලයුතු බවද වැඩිදුරටත් දැනුම්දෙමි.

ආර්.එම්.ඩබ්.එස්. සමරදිවාකර
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

පිටපත් :-

01. ආණ්ඩුකාරවර ලේකම්, ආණ්ඩුකාර කාර්යාලය, උතුරු මැද පළාත - දැ.පි.
02. විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය , අනුරාධපුර - දැ.පි
03. ප්‍රධාන අභ්‍යන්තර විගණක, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව, උ.මැ.ප - දැ.පි.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පුහුණු / பயிற்சி / Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planing | ඉංජිනේරු / பொறியியல் / Engineering | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|---|
| දුරකථනය / தொ.பே.இல / Telephone | 025-2224915 | 025-2228262 | 025-2237430 | 025-2222238 | 025-2220910 | 025-2222736 |
| ෆැක්ස් / பெக்ஸ் / Fax | 025-2222736 | 025-2220950 | 025-2237430 | 025-2225295 | 025-2235787 | 025-2222736 |